කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

සමාජීයවිද්‍යා පීඨය

සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමණාකරණ

**Tourism and Cultural Resources Management**

සංචාරණයේ ඉතිහාසය

**History of Tourism TCRM E - 1025**

ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු ලියන්න.

**Answer four (4) questions only.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 / 03 hours

---

1) Discuss the history of Mass Tourism and its impact on society, economy and environment. (20 marks)

බහුජන සංචරණයේ ඉතිහාසය හා එමගින් ඇති වූ සමාජයීය, ආර්ථික හා පාරිසරික බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 20)

2) 'Grand Tour in 17th Century, paved the way for noble society in Europe to penetrate the world through artistic view.' Explain this statement with historical background of the Grand Tour. (20 marks)

'17 වන සියවසේදී සිදු වූ මහා සංචරණය තුළින් යුරෝපයේ විසූ වංශවත් පැළැන්තියට කලාත්මක දෘෂ්ටියකින් ලෝකය විනිවිද යන්නට අවස්ථාවක් උදා විය.' මහා සංචරණයේ ඓතිහාසික පසුබිම ඇසුරෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 20)

3) 'Transportation is directly affecting on tourism industry.' Discuss this statement from relevant examples of world transportation history. (20 marks)

සංචාරක කර්මාන්තය කෙරෙහි ප්‍රවාහනය සෘජු බලපෑමක් එල්ල කරනු ලබයි. ලෝකයේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉතිහාසය ඇසුරෙන් නිදසුන් ගෙන මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

4) Discuss the significances in tourist services, travel motivations and tourist behavior in Egyptian, Greek and Roman Empirical Eras in ancient world. (20 marks)

පුරාතන ලෝකයේ ඊජිප්තු, ග්‍රීක හා රෝම අධිරාජ්‍ය යුගයන්හි දක්නට ලැබෙන සංචාරක සේවා, සංචාරකයාගේ සංචාරණ පෙළඹවීම් හා හැසිරීම පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

5) Pilgrimages can be considered as a prominent aspect in ancient domestic tourism in Sri Lanka. Select two (02) of famous pilgrim destinations and discuss the relevancy of those destinations for the growth of domestic tourism in the country. (20 marks)

අතීත ශ්‍රී ලංකාවේ දේශීය සංචරණය තුළ වැදගත් මුහුණුවරක් ලෙස වන්දනා පාදක කරගත් සංචරණය හඳුනා ගත හැක. ශ්‍රී ලංකාවේ වන්දනා චාරිකා සඳහා ප්‍රසිද්ධ ගමනාන්ත දෙකක් (02) තෝරා ගනිමින් , දේශීය සංචරණයේ ප්‍රගමනයට එම ස්ථානයන්හි අදාළත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

6) With establishment of Ceylon Tourist Bureau in 1937, the tourism was taken attention as an economic activity in Sri Lankan history. Give explanation on the important milestones of the history of tourism industry in Sri Lanka. (20 marks)

1937 දී ලංකා සංචාරක කාර්යාංශය පිහිටුවීමත් සමග සංචරණය ආර්ථික ක්‍රියාකාරකමක් ලෙස ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ අවධානයට ලක් විය. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ඉතිහාසයට අදාළ වැදගත් සන්දිස්ථාන පිළිබද පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 20)

7) Discuss the background of ancient traveler in Sri Lanka with examples from Sigiriya heritage site. (20 marks)

සීගිරිය උරුම ස්ථානය ඇසුරින් ශ්‍රී ලංකාවේ පුරාතන සංචාරකයාගේ පසුබිම පැහැදිලි කරන්න. (ලකුණු 20)

8) 'Compared to 20th Century, Sri Lankan tourism industry in 21st Century is depicting significant growth in all aspects of tourism infrastructure, accommodation and other tourist services while enhancing visitor experience.' Do you agree with this statement? Justify your answer with comparison of past and present tourism industry in Sri Lanka.

(20 marks)

සංචාරක අත්දැකීම් පුළුල් කරමින්, සංචාරක යටිතල පහසුකම්, නවාතැන් පහසුකම් හා අනෙකුත් සංචාරක සේවා ආශ්‍රිතව කැපීපෙනෙන වෙනසක් 20 වන සියවසට සාපේක්ෂව 21 වන සියවස තුළ ශ්‍රී ලංකාවේ සිදු වී ඇත. මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ අතීත හා වර්තමාන තත්ත්වයන් ඇසුරින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

**********************